

විදුදය
භාෂා, සාහිත්‍ය, සංස්කෘතික හා මාධ්‍ය අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

VIDUDAYA
Journal of Language, Literary, Cultural and Media Studies
Department of Sinhala and Mass Communication, University of Sri Jayewardenepura

2024, 03 (02): 10-22

ISSN: 3051-5424

Journal homepage: https://journals.sjp.ac.lk/index.php/vidudaya

සැළලිහිණි සහ ගිරා සන්දේශවල කාව්‍යාන්තර්ගතයේ සමානතා පිළිබඳ සන්සන්දනාත්මක අධ්‍යයනයක්

හංසමාලා රිටිගහපොළ

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
hansamala@sjp.ac.lk

Abstract

The Kotte era is considered the golden age not only of Sinhala poetic literature but also of Sinhala Sandesha (messenger poem) literature. This is due to the addition of many poetic work written under various subjects to Sinhala poetry and the composition of almost five Sandeshas which are highly respected in the Sinhala Sandesha tradition. The most popular Sandeshas in Sandesha literature are the Parevi (Dove), Kokila (Cuckoo), Salalihini (Hill Myna), Gira (Parrot), and Hansa (Swan) Sandeshas. When considering these Sandeshas written in the Kotte era, various characteristics and special facts can be revealed about each one. These Sandeshas can also be observed as a mirror reflecting contemporary Sri Lankan society. In particular, this study focuses on the Salalihini Sandeshaya and the Gira Sandeshaya. There are several reasons for this choice. One reason is that these two Sandeshas lucidly convey the Sandesha society of that time. Another reason is that the author of the Gira Sandeshaya intended to glorify Thotagamuwe Sri Rahula Thero, who composed the Salalihini Sandeshaya. Additionally, the author of the Gira Sandeshaya also represents the same monastic lineage as the author of the Salalihini Sandeshaya.For these reasons, this study is based on the Salalihini Sandeshaya and the Gira Sandeshaya, as they reveal a range of subjects which have not been compared before. This study employs a textual analytical methodology to compare the poetic content of the two Sandeshas and is a qualitative review.

Key words: Salalihini Sandeshaya, Gira Sandeshaya, Teacher's Clan, Kotte era

1. හැඳින්වීම

සිංහල සන්දේශාවලියෙහි ගෞරවාදරයට පාත්‍රවූ සන්දේශ අතුරින් ප්‍රධානතම සන්දේශ පහ රචනා වූයේ කෝට්ටේ යුගයේදීය (ධම්මරතන හිමි,1964-1965:25). ඒ, පරෙවි, කෝකිල, සැළලිහිණි, ගිරා, හංස යන සන්දේශ පහයි. මෙකී සියලුම සන්දේශ අතුරින් මෙම අධ්‍යයනයේදී සන්සන්දනයට පාත්‍ර වන සන්දේශද්වයය වන්නේ සැළලිහිණි සන්දේශය හා ගිරා සන්දේශයයි. ''ගිරා සන්දේශය වූකලි මයූර, සැළලිහිණි සම්මිශ්‍රණයෙන් ඇතිවූ විකාශනයක ඵලයක් ලෙස සැලකිය හැකිය. මයූරයේ ශබ්ද මාධූර්යයත්, සැළලිහිණියේ ගැඹුරු බස හා පද ලාලිත්‍යයත් සුලබ ලෙස ගිරා සන්දේශයේ වෙයි'' (වීරසිංහ,1953:61). තවද සැළලිහිණිය රචනා කළ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් උත්කර්ෂයෙන් වර්ණනා කිරීම, ගිරා සන්දේශ කතුවරයාගේ අභිමතාර්ථය වී ඇත. ''මේ සන්දේශකරණයෙහි (ගිරා) මුඛ්‍යාර්ථය සවැනි පැරකුම් රජුට සෙත් පැතීමට වඩා සිරි රහල් හිමියන් උත්කර්ෂයෙන් වර්ණනා කිරීමයි'' (ධම්මරතන හිමි,1964-1965:25). විචාරක අදහස වන්නේ ගිරාවේ නම සඳහන් නොවන කතුවරයා වනාහි රාහුල හිමියන්ට පක්ෂපාතී හිමිනමක් බවයි. ''ගිරා සන්දේශය තොටගමුවේ ශ්‍රී රාහුල සංඝරාජතුමන්ට පක්ෂපාතීත්වය දැක්වූ ග්‍රාමවාසී පක්ෂයේ යතිවරයෙකු විසින් රචිත වූවක් බව සිතාගත හැක. ඇතැමෙක් මෙහි කතුවරයා වෑත්තෑවේ හිමිතුමන් යැයි ශංඛා කරති'' (සීලවංස හිමි,1964-1965:90). එහෙත් මේ මතයට පටහැනිව ඊ. තෙන්නකෝන් අදහස් දක්වා ඇත. ''මේ අසුන් කව කරන ලද්දේ ගුත්තිල දා කව කළ වෑත්තෑවේ හිමියන් වියැ යුතු යැයි අයෙක් සිතති. එහෙත් නිකම්මැ හිතලුවක් මිසැ කරුණු සහිත ඇඟීමක් හැටියට එය ගණන් ගැනීමට ඉඩෙක් නැත්තේයි (තෙන්නකෝන්,1960:86). එසේ වුවද ගිරාවේ කතුවරයා රාහුල හිමිට පක්ෂපාතී හිමිනමක් යැයි බන්දුසේන ගුණසේකර අදහස් පළ කර ඇත. ''තොටගමුවේ රාහුල සංඝරාජ ස්වාමිපාදයන් ග්‍රාමවාසී නිකායික පරපුරේ ප්‍රධානියා ලෙස එවක සැලකිණි... ගිරා සන්දේශයත්, හංස සන්දේශයත් මෙම නිකායද්වයයේ නායක හිමිවරුන් වර්ණනා කෙරෙන සැටියෙන්ද එම වෙනස මතුව පෙනේ'' (ගුණසේකර,වර්ෂයක් නැත:128). මෙහි සඳහන් පරිදි හංස සන්දේශය නියෝජනය කරනුයේ වනවාසී නිකායයි. ඒ අනුව ගිරාව රාහුල හිමිට පක්ෂපාතීත්වයක් දරන හිමිනමකගේ රචනයක් බවට ගුණසේකර පළ කරන අදහසෙහි සත්‍යතාවක් ඇති බව පැහැදිලි වේ. එනම්, ගිරා සන්දේශ රචකයා නියෝජනය කරන්නේ සැළලිහිණි රචකයා නියෝජනය කරන භික්ෂු පරම්පරාව බව ඒ අනුව සාක්ෂාත් වේ.

තවද සැළලිහිණි හා ගිරා යන සන්දේශවල සන්දේශ හාරකයන් දෙදෙනාම සන්දේශය රැගෙන පිටත්වන්නේ එකම ස්ථානයකිනි. එබැවින් එකී සන්දේශවලින් කෝට්ටේ පුරවරයේ තතු පැහැදිලිව විද්‍යමාන වන බව නිරීක්ෂණය වේ. දෙදෙනාටම එදවස රජ කළ හයවැනි පරාක්‍රමබාහු රජු සම්මුඛ වී ඇත. මෙබඳු කරුණු හේතුවෙන් මෙතෙක් සන්සන්දනය නොකෙරුණු විෂය පරාසයක් සැළලිහිණි සන්දේශයත් ගිරා සන්දේශයත් සන්සන්දනය කිරීමෙන් අනාවරණය කර ගැනීමට හැකි වී තිබේ. මෙම අධ්‍යයනය සැළලිහිණි හා ගිරා සන්දේශ පාදක කරගනිමින් සිදු කෙරෙනුයේ එබැවිනි.

2. ක්‍රමවේදය

මෙම අධ්‍යයනය මුද්‍රිත මූලාශ්‍රය පදනම් කරගනිමින් පාඨ්‍ය විශ්ලේෂණාත්මක ක්‍රමවේදය උපයෝගී කොටගෙන සිදු කෙරෙන ගුණාත්මක විමර්ශනයකි. මෙහි ප්‍රාථමික මූලාශ්‍රය වසයෙන් භාවිත කරන ලද්දේ සැළලිහිණි සන්දේශය හා ගිරා සන්දේශයයි. එකී සන්දේශවල කාව්‍යාන්තර්ගතයේ ඇති සමානතා විමර්ශනය කිරීමෙහිලා භාවිත ද්විතීයික මූලාශ්‍රය වන්නේ අනෙකුත් ශාස්ත්‍රීය ග්‍රන්ථ, පර්යේෂණ ලිපිය.

3. සාකච්ඡාව

සන්දේශ රචනා කරනුයේ ඊට අදාළවූ නීති-රීති පද්ධතියකින් හා ප්‍රේෂක (යවන්නා), හාරක (ගෙනියන්නා), ග්‍රාහක (ලබන්නා), සන්දේශය (පණිවිඩය) යන ප්‍රධාන ලක්ෂණවලින් යුක්තවය. ඊට අමතරව සන්දේශයේ කථා නායකයා ප්‍රසිද්ධ පුරුෂයකු හෝ ගැහැනියක විය යුතුය, දූතයා උසස් වංශයකට අයත් විය යුතුය, කාව්‍ය ඇරඹිය යුත්තේ ඉතිහාස කථාවකින් හෝ ආසිරි පැතීමකිනි. දෙවනුව, සුව දුක් විචාරීම් ආදියෙන් යුතුව දූතයා වර්ණනා විය යුතුය, යා යුතු විස්තර දැක්විය යුතුය, ගමන් මගද ඒ මගෙහි ගම් පෙදෙස්වල නායකයන්ගේ ගුණ වැනුම්ද හසුනද විස්තර කර අවසානයේ දූතයාට ආසිරි ප්‍රාර්ථනා කළ යුතුය යන නියමද සන්දේශ රචනයේදී අනිවාර්ය විය (සන්නස්ගල,1962:6-7). ඒ අනුව මෙකී අධ්‍යයනයට පාත්‍ර වන සැළලිහිණි හා ගිරා සන්දේශ රචනා වී ඇත්තේද උක්ත නීතිරීති හා නියමවලට අනුකූලවයි. සැළලිහිණි සන්දේශයේ (ක්‍රි.ව.1450) ප්‍රේෂක හෙවත් යවන්නා වී ඇත්තේ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ය. හාරකයා හෙවත් යවන්නා සැළලිහිණියාය. කැලණිය රජමහා විහාරයේ ස්ථාපිත දේවාලයට අධිගෘහිත විභීෂණ දෙවියන් සන්දේශ ග්‍රාහකයාය. සවැනි පැරකුම් රජුගේ දියණියවූ උලකුඩය දේවියට සුදුසු පුත් රුවනක් ලබාදෙන ලෙස දෙවියන්ගෙන් අයැදීම සන්දේශයයි. ගිරා සන්දේශයේ (ක්‍රි.ව.1457-1465) ප්‍රේෂක හෙවත් යවන්නා පිළිබඳව ඇත්තේ අනුමානයක් පමණි. කෝට්ටේ පුරවරයේ විසූ තොටගමුවේ ශ්‍රී රාහුල හිමිට පක්ෂපාතවූ හිමිනමක් මෙහි රචකයා වන්නට ඇති බව විචාරක අදහසයි. ගිරවා සන්දේශ හාරකයා වී ඇති අතර ග්‍රාහකයා වී ඇත්තේ නාථ දෙවියන්ය. සිරි පැරකුම් රජුත් මෙරට බුදු සසුනත් ආරක්ෂා කර දෙන ලෙස සැළලිහිණි සන්දේශ කර්තෘවූ තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ලවා නාථ දෙවියන් වෙත දැනුම් දීම සන්දේශගත පණිවිඩයයි (නාරද හිමි,2005:113). මෙම නීති-රීති ප්‍රකාරව රචිත මේ සන්දේශද්වයයේ සමානතා සන්දේශාරම්භයේ සිටම දැකිය හැකිය. මේ සමානතා බහුලවම ප්‍රකට වන්නේ සන්දේශ දෙකෙහිදීම එකම කාරණා ප්‍රස්තුත කොට ඇති අවස්ථාවලදීය. එය පහත දැක්වෙන ලෙස වර්ග කර විමර්ශනය කළ හැකිවේ.

3.1. පුර වර්ණනා

සැළලිහිණි සහ ගිරා සන්දේශවල සන්දේශ මාර්ගය ආරම්භ වන්නේ කෝට්ටේ නගරයේ සිටය. සැළලිහිණියා කෝට්ටේ සිට කැලණිය දක්වා සිය සන්දේශය රැගෙන ගිය අතර ගිරවා සිය සන්දේශය රැගෙන ගියේ කෝට්ටේ සිට තොටගමුව දක්වාය. යට දැක්වූ නීතිරීති ප්‍රකාරව ස්වකීය සන්දේශ රචනයේදී සැළලිහිණි හා ගිරා සන්දේශකරුවන් දෙදෙනාම ආසිරි දක්වා සැපදුක් විමසීමෙන් පසු අදාළ අවශ්‍ය කටයුතු නිර්දේශ කර ඇත. එහිදී කවීන් දෙදෙනාටම ජයවර්ධනපුරය වර්ණනා කිරීමෙන් බැහැර වීමට නොහැකි වී ඇත. ඒ, ස්වකීය හාරකයන් වන සැළලිහිණියාටත් ගිරවාටත් දූත මෙහෙය වෙනුවෙන් පිටත්වීමට සිදුව ඇත්තේ කෝට්ටේ නගරයෙන් වීම නිසාය. සැළලිහිණි කවියා සිය හාරකයාට ජයවර්ධනපුරයේ ආශ්චර්යය වර්ණනාඪ්‍යයෙන් කියා දී ඇත්තේ මෙසේය.

පොහොසද්දන ඇති තුනුරුවන බැති පෙම - මුළු වද්දන සුර පුර පිරි සිරින් හැම

ජයවද්දන කැරුමෙන් සුසැදු තම නම - ජයවද්දන පුරවර දනු මිතුරු තුම

(උතුම් මිතුර, තුනුරුවන්හි භක්ති ප්‍රේමය ඇති පොහොසත් ජනයා ඇති, පිරුණාවූ සියලු සම්පත්තියෙන් දිව්‍යපුරය මුළුගන්වන ජයවර්ධනය හේතු කොටගෙන ජයවර්ධන යන තම නාමය අන්වර්ථ කළාවූ ජයවර්ධන පුරවරය දැන ගනුව) (ගුණවර්ධන, 1997:42-43).

ආසිරි දක්වා දූතයාට ප්‍රශංසා කර දූතයාගේ කාර්යභාරය දක්වන ගිරාකරුවාද ස්වකීය හාරකයාට ජයවර්ධනපුරයේ අසිරිය දක්වන්නේ සැළලිහිණිකරුවා දැක්වූ අයුරින්මය.

ජයවද්දන දැනුමැ'ති මැති යුත් පවර - රුපුමද්දන ගජ හය සෙන් පිරි නිතොර

නොවරද්දන සගමොක් මුනි දහම'කර - ජයවද්දන පුරවර මෙය දනු මිතුර

(මිත්‍රය, ජය වර්ධනය කරන්නාවූ දැනුම සහිත උතුම් අමාත්‍යයන් ඇති, සතුරන් මර්දනය කරන හස්ති, අශ්ව සේනාවන් නිතර පිරුණු ස්වර්ග මෝක්ෂ සම්පත් නොවරදවා ලබා දෙන බුද්ධ ධර්මයට ආකරයක්වූ ජයවර්ධනපුරය මේ යැයි දැන ගන්න) (ප්‍රේමරත්න,2002:72).

ජයවර්ධනපුරය වනාහි තුනුරුවන් කෙරෙහි භක්ති ප්‍රේමයෙන් යුත් ජනයාගෙන් අනූනවූ භූමියක් ලෙස සැළලිහිණිකරුවා සඳහන් කරන විට ස්වර්ග මෝක්ෂ සම්පත් නොවරදවා ලබා දෙන බුද්ධ ධර්මයට ආකාරයක්වූ ජයවර්ධනපුරය යනු මෙය යැයි ගිරාකරුවා පවසා ඇත. මේ දෙදෙනාම කවියෙහි අවසන් පදය යොදා ඇත්තේ එක සමාන අර්ථයක් ගම්‍යමාන වන අයුරිනි. එනම්, සැළලිහිණිකරුවා අනුගමනය කළ පද්‍ය රචනා රටාව ඒ අයුරින්ම ගිරාකරුවාද අනුගමනය කර ඇති බවයි.

පුරයේ කලබලකාරී බව සහ ඝෝෂාකාරී බව පවසන්නට සැළලිහිණිකරුවාත් ගිරාකරුවාත් යොදාගෙන ඇත්තේ එකමාකාරයේ උපමා රූපකය. එකම සංසිද්ධියක්ය. කාව්‍යාන්තර්ගතයේ ස්වල්ප වෙනසක් කර ඇති ආකාරය පැහැදිලිවම දැකිය හැකිය. ඇතුන් සහ අශ්වයන් උපුටා දක්වමින් ජයවර්ධනපුරයේ සමෘද්ධිය පැවසීමට උත්සාහ කළ සැළලිහිණිකරුවා ඒ බව ප්‍රකාශ ඇත්තේ මෙසේය.

දුවන බඳ කිකිණි හය කුර පහර නද - සවන තල නිනද ගිජිඳුන් සෙමෙර බඳ

රවන නොයෙක තුරු ජය සක් හඬ නො මඳ - දෙවන මුහුද මෙන් ගුම් ගති පුර නිබඳ

(රහු ගෙඩි බැඳි දුවන අසුන්ගේ කුර පහරින් නැගි නාදයෙන්ද සෙමෙර බැඳි ඇතුන්ගේ කන්තල නාදයෙන්ද වයන නොයෙකුත් තූර්ය නාදයෙන් හා ජයසක් ගෙඩි පිඹීමේ නාදයෙන්ද ජයවර්ධන පුරය දෙවෙනි මුහුදක් සේ නිතර ගිගුම් දුන්නේය) (ගුණවර්ධන, 1997:46).

ගිරාකරුවා එකී සමෘද්ධිය පවසා ඇත්තේ මෙපරිද්දෙනි.

හයකුර ගසින් නැඟි රදසින් හිවි අඹර - ගජ කන්තලින් එන පවනින් යුත් මෙපුර

කෙළි සන්තොසින් රැඳි සලෙළුන්හට නිතොර - සැඬකර රසින් සැඬ ගිමනින් දුක් කවර

(නගරාකාශය අශ්වයන්ගේ කුර ගැසීමෙන් නැංග ධූලියෙන් වැසී තිබෙයි. එසේම ඇතුන්ගේ කන්තලින් එන සුළඟින්ද යුක්තය. එබැවින් නිතර ක්‍රීඩා සන්තෝෂයෙන් වසන කාමුක ජනතාවට හිරු රැසින් හෝ චණ්ඩ ග්‍රීෂ්මයෙන් දුකෙක් නැත) (පියරතන හිමි,1991:77).

ජයවර්ධනපුරයේ ශ්‍රී විභූතිය, සමෘද්ධිය පැවසීමට යන උක්ත කවීන් දෙදෙනාටම වස්තුවිෂය වී ඇත්තේ අශ්වයන්ගේ කුර ගැසීම හා ඇතුන්ගේ කන්තල සෙලවීමය. සැළලිහිණිකරුවාට අනුව සතුන්ගේ මේ ක්‍රියාවලින් ගීතවත් නාදයක් ඇතිවී අනෙක් තූර්ය නාද හා එක්වී ජයවර්ධනපුරයෙහි මහත් ඝෝංකාරයක් නැගී ඇත. එනම්, ජනාකීර්ණ නගරයක විවිධ හඬ, සහ ව්‍යාකුල බව ව්‍යංග්‍යාර්ථවත් කර ඇත. එකී ජනාකීර්ණ බව ගිරාකරුවා පවසා ඇත්තේ අශ්වයන්ගේ කුර ගැසීමෙන් ධූලි වලාවන් නැගීමෙන් හා ඇතුන්ගේ කන්තලින් එන සුළඟින් දාහය නිවී යන බවත්, කාමුක ජනතාව ක්‍රීඩා විලාසයෙන් කල් ගෙවන බවත් දැක්වීමෙන්ය. කවීන් දෙදෙනාම මෙහිදී උත්සාහ දරා ඇත්තේ ජයවර්ධනපුරය සතු ඇත්, අස් සමූහයේ විශාලත්වය පැවසීමට බව මින් පැහැදිලි වේ.

සන්දේශය රැගෙන යන ගමනේදී ගිරවා සහ සැළලිහිණියා යන දෙදෙනාටම දළදාවහන්සේ වන්දනාමාන කර ගැනීමේ අවස්ථාව සැලසේ. ඒ වන්දනය සඳහා දෙදෙනාම යොදා ගෙන ඇත්තේ එකම විරිතයි. එහෙත් ගිරාකරුවා සිය කවිය අර්ථවත් කර ඇත්තේ විෂ්ණු දෙවියන් ගැන කියවෙන පුරාණෝක්තියකිනි. එහෙත් සැළලිහිණියේ දැක්වෙන පරිදි ''ද'' කාරයම සිය කවියේදීත් භාවිත කිරීමට ගිරාකරුවා උත්සාහ දරා ඇත.

ලොවැ විහිදා සුදු පැහැ සඳ රැසෙව් සැදී - දෙන නොමදා සිරි සඟමොක් සැප නිසැදී

ලද මුනිදා දම් කඳ පහස මන බැඳී - වඳු දළදා හිමි තෙමහල් පහය රැඳී

(සඳ රැස් සේ සැදි සුදු බුදු රැස් ලෝකයෙහි විහිදුවා නිතර ස්වර්ග මෝක්ෂ සැප ළඟා කර දෙන බුදුන්වහන්සේගේ සිතෙහි බැඳුණු සුවාසූ දහසක් ධර්ම ස්කන්ධයෙහි පහස ලැබූ තුන් මහල් දළදා මාලිගාවෙහි වැඩ හිඳින දන්ත ධාතූන් වහන්සේ වඳින්න) (ගුණවර්ධන, 1997:55).

සුචරිත ගම්ලත් මේ කවිය ගැන පළ කර ඇති අදහස මෙබඳුය. ''මේ පද්‍යය කියවන්නාවූ සහෘදයාට ශාන්තිනායකවූ බුදුරජාණන්වහන්සේගේ අනන්ත අනුකම්පාව හා ලොව පතළාවූ මෛත්‍රී කරුණාව සත්ත්වයාගේ කෙලෙස් තැවුල් නිවමින් පැතිරෙන ආකාරය සිහිවේ... සත්ත්වයන්ගේ භේද නොතකා චන්ද්‍රයා සෑම දෙනාහටම ස්වකීය රශ්මි සම්පත්තිය ප්‍රදානය කරන්නාක් මෙන් මාගේ ස්වාමිදරුවූ සම්මා සම්බුදුරජාණන්වහන්සේ සිසිල් වූ මෙත් කුලුණු රැස් ලොව මුළුල්ලේ නොමසුරුව විහිදුවා හැර සෑම දෙනාහට සගමොක් සැප සලසා දෙන නියා ව්‍යංගයෙන් කියවේ'' (ගම්ලත්,2006:28). කරුණු එසේ වුවද ගිරාකරුවා දළදාවහන්සේ වන්දනා කිරීමට ගිරවාට නියම කරනුයේ හින්දු පුරාණෝක්තිය උපුටා ගනිමින් විෂ්ණුගේ වීරත්වයද විදහා දක්වමිනි.

පෙර උව්දා ගෙන ගිරිඳා කිරි සයුර - කළඹනදා නැඟි නොමදා ගොස අයුර

තුරු සමුදා නද ඇම දා දෙන නොහැර - වැද දළදා ගෙට දළදා වඳු මිතුර

(මිතුර, අතීතයේදී විෂ්ණු මන්දාර පර්වතය ගෙන කිරි සයුර කළඹන දිනයේදී නැගුණ අනන්තවූ ඝෝෂාව පරිද්දෙන් වාද්‍ය භාණ්ඩ සමූහය දවසක් නෑර නාද දෙන්නාවූ දළදා මැඳුරට පිවිස දන්ත ධාතූන්වහන්සේ වඳින්න) (ප්‍රේමරත්න,2002:103).

ඉහත කවි දෙකෙහිම ආරම්භයේ එළි සමය දක්වා ඇත්තේ එකාකාරයටය. අවසානයේදී සැළලිහිණිකරුවා ''තුන් මහල් දළදා මාලිගාවෙහි වැඩ හිඳින දන්ත ධාතූන් වහන්සේ වඳින්න'' යයි ''වඳු දළදා'' යනුවෙන් සිය දූතයාට අණ කර ඇත. එපරිද්දෙන්ම ගිරාකරුවා සිය දූතයාට විධානය කර ඇත්තේ ''දළදා මැඳුරට පිවිස දන්ත ධාතූන්වහන්සේ වඳින්න'' යයි ''වැද දළදා ගෙට දළදා වඳු'' යනුවෙනි. මෙයිනුදු පැහැදිලි වන්නේ ගිරාකරුවා සැළලිහිණිය අනුගමනය කර ඇති ආකාරයයි. කෙසේ වුවද ගිරාකරුවාගේ මේ කවියෙහි පද සංඝටනාව වඩාත් සමීප වන්නේ සැළලිහිණියෙහි දළදා වහන්සේ ගැන කියවෙන යට දැක්වූ කවියට නොවේ. සැළලිහිණියෙහි සඳහන් වන කැලණියේ වටදා ගෙය වර්ණනා කළ පහත දැක්වෙන කවියටය.

පෙර උව්දා ගෙන ගිරිඳා සිඳු සලත - නැගි පැහැදා පෙණ සමුදා සැටි නුමුත

මෙන උළිදා පැහැ විහිදා නෙදිගු බිත - සැදි වටදා ගෙහි වඳුදා ගැබ දිමුත

(අතීතයේදී විෂ්ණු මහමෙර ගෙන කිරි සයුර කළඹන විට එයින් නැගුණු පෙණ රැසෙහි ආකාරය අත් නොහැරියාවූ සඳේ ස්වභාවය නොයෙක් දිශාවන්හි පතුරුවා සිටි වටදාගෙයි බබළන දාගැබ වඳින්න) (ගුණවර්ධන, 1997:113).

මෙහිදී සැළලිහිණිකරුවා පැහැදිලිවම යොදාගෙන ඇත්තේ විෂ්ණු දෙවියන් මහමේරු හෙවත් මන්දාර පර්වතය ගෙන ක්ෂීර සාගරය කැළඹවීමේ පුරාණෝක්තියයි. ගිරාකරුවා කාව්‍යාන්තර්ගතය මතු නොව සැළලිහිණියේ

සඳහන් වචනද ඒ අයුරින්ම සිය කවියට යොදාගෙන ඇති ආකාරය කාව්‍යද්වයය සන්සන්දනය කිරීමේදී මනාව පැහැදිලි වේ.

3.2. රාජ වර්ණනා

ශ්‍රී ජයවර්ධනපුරය සිය රාජධානිය කොටගත් හයවෙනි පරාක්‍රමබාහු රජුද කෝට්ටේ යුගයේ රචිත සියලුම සන්දේශවලදී අති උත්කර්ෂයෙන් වර්ණනා කර තිබෙනු දැකිය හැකිය. එසේ වුවද සැළලිහිණිකරුවාටත් ගිරාකරුවාටත් පැරකුම් රජු වර්ණනයේදී සිහිපත් වන්නේ එකම කරුණුය. ඔවුන් රජු දකින්නේ විෂ්ණු දෙවියන්ගේ රූපාකාරයෙනි. විෂ්ණු දෙවියන්ගේ ගුණාංගයන්ගෙනි. සැළලිහිණියේදී පැරකුම් රජු සිංහාසනාරූඪ වී සිටින්නේ විෂ්ණු දෙවියන් බඳු ආකාරයෙන් බව කවියා දක්වන විට ගිරාකරුවා එතුමන් උත්තරීතර ගුණයෙන් විෂ්ණුට සම කර ඇත.

උනු නොව බරණ සිවුසැට වොටුනුත් පැලඳ - වෙනු මෙන් පසක් උන් සඳ සීහසුන් මැද

මනු රජ කුලෙන් පැවතෙන පිළිවෙළ නොසිඳ - ගනු අවසර එනිරිඳු සිරි පතුල් වැඳ

(ඔටුන්න සහිත සිවු සැටක් ආභරණ පැලඳ නෙතට පෙනෙන විෂ්ණු සේ සිංහාසනයෙහි සිටි කල්හි මනු වංශයෙන් පැවතෙන ඒ පැරකුම්බා එනිරිඳු සිරි පතුල් වැඳ අවසර ගනු) (ගුණවර්ධන, 1997:60).

මෙහි 'වෙනු' ලෙස දක්වා ඇත්තේ විෂ්ණුය. එක් අතකින් හක් ගෙඩියක් හා අනිත් අතින් චක්‍රායුධයක් දරන විෂ්ණු හැඳින්වීමට නම් ගණනාවක් තිබේ. ගිරාකරුවා සිය වර්ණනාවේදී විෂ්ණු හඳුන්වාදී ඇත්තේ 'සකත' ලෙසිනි. සකත යනු සකක් හෙවත් චක්‍රායුධයක් අතෙහි ඇත්තා යන අර්ථයයි.

සකත අයුරු පැරකුම් නිරිඳුගෙ පවර - සමත විපුල් බල සිවුරඟ සෙන් ළතර

දිගත පැමිණ කොද නොපහළ රුපු නුවර - යුගත සයුරු රළ නොපහළ තැන් කවර

(යුගාන්ත සාගරයේ රළ පහර නොදුන් තැනෙක් යම් සේ නැතිද, එසේම පැරකුම් රජුගේ සිවුරඟ සෙනඟ ඒ ඒ දිශාවන්ගේ අන්තයට හෝ දිශාවනට පැමිණ පහර නොදුන් සතුරු නුවරක් නැත්තේය. ඒ රජ, විෂ්ණු මෙන් බලවත්ය. රජුගේ සෙනඟද දක්ෂය. මහත් බල සහිතය. දැඩි සිත් ඇත්තේය) (පියරතන හිමි,1991:97).

මෙහි දක්වා ඇති යුගාන්ත සාගරය යනු කෘත, ත්‍රෙතා, ද්වාපර හා කලි යන යුග සතරෙහි අවසන් යුගය වන කලියුගයේ අන්තයේදී ඉතා දරුණු වන මුහුදයි. මුහුද දරුණු වීමෙන් අනතුරුව මේ කලියුගය අවසානයේදී ලෝකය වැනසෙන බවයි.

හින්දු පුරාණෝක්තීන්ට අනුව විෂ්ණු දෙවියන් වනාහි ආරක්ෂකයාය. එතුමාගේ භාර්යාව වන ලක්ෂ්මී යනු ශ්‍රියා කාන්තාවයි. ''විෂ්ණු තෙමේ වනාහි මූර්තිත්‍රයාන්තර්ගත ලෝක සංරක්ෂණයෙහි නියුක්තවූ මහානුභාව සම්පන්න දෙවියෙකි. මොහු කෘෂ්ණ වර්ණය; බාහු සතරකින් යුක්තය; පීත වර්ණ වස්ත්‍රයක් නිවාසනය කොට ඇත්තේය; චක්‍රයක් ආයුධ කොට ඇත්තේය. ශ්‍රී කාන්තා තොමෝ භාර්යා වූවාය. දිව්‍ය මනුෂ්‍යයන්ට පීඩාකර අවස්ථාවලදී මේ තෙම ඊට පිටිවහල්ව ඒ පීඩාවෙන් වළක්වා සැප ගෙනදේ යයි වෛෂ්ණවයන්ගේ මතයයි (ගම්ලත්,1995:47). එනිසාම මේ කවීහු සිය වර්ණනාවලට විෂ්ණු දෙවියන් මෙන්ම ලක්ෂ්මී දෙවඟනද පාදක කර ගත්හ.

රිවිබිම්බා යුරු රිවිකුල කමලකර - පියුමම්බා නිතොරව රැඳි උර මැදුර

මෙන රම්බා හිමි රූ සිරිනි මනහර - පැරකුම්බා නරනිඳු සඳ දකු මිතුර

(මිතුර, රිවිකුල නමැති පියුම්විලට සූර්යයා වැනිවූ හද මැඳුරෙහි නිතර ශ්‍රියා කාන්තාව වසන, රූප ශෝබාවෙන් නල කුවේරයා එනම්, රම්භා නම්වූ දිව්‍යාංගනාවගේ සැමියා හා සමානවූ පැරකුම් රජු දකින්න) (ගුණවර්ධන, 1997:58).

පැරකුම් රජු රට එක්සේසත් කරගනිමින්, රට ආරක්ෂා කළ තැනැත්තා වීම විෂ්ණු දෙවියන් හා සම කිරීමට කවියාට හේතුවක්වී ඇති බව පෙනේ. ශ්‍රියා කාන්තාව නිරන්තරව පැරකුම් රජුගේ උරමැඳුරෙහි වාසය කරන බව සැළලිහිණිකරුවා දක්වා ඇත්තේ ඒ සම කිරීම නිසා බව අනුමාන කළ හැකිය. ''පියුමම්බා යනු ශ්‍රී කාන්තා තොමෝයි. දිව්‍යාසුරයන් විසින් මන්දර පර්වතය ක්ෂීර සාගරයෙහිලා මථනය කරන කල්හි රූප සම්පත්තියෙන් අග්‍රප්‍රාප්තවූ මෝතොමෝ එයින් උද්ගත වූවා දිව්‍යාසුරයන් බලාසිටියදීම විෂ්ණුගේ වක්ෂඃස්ථලය කරා ගමන් කළාය. ශ්‍රී කාන්තාවගේ වාසස්ථානයවූ නිසා විෂ්ණු දිව්‍යරාජයාගේ උරඃස්ථලය අතිශය ශෝබමාන විය'' (ගම්ලත්,1995:45-46). මෙකරුණ පාදක කරගනිමින් පැරකුම් රජුගේ ශ්‍රී සම්පත්තිය ධ්වනිතාර්ථවත් කිරීමට සැළලිහිණිකරුවාට අවකාශ සැලසී ඇත. ගිරා සඳෙසෙහිද පැරකුම් රජු වූකලි සිරිකතගේ පද්මය ලෙස සඳහන් කිරීමෙන් ඒ මතය මැනවින් සනාථ වී ඇත. ඒ මෙසේය.

සතසිත රැඳි නිමල් ගුණ පසිඳු විකුමැති - සිරිකත සිරි කමල් වැනි මෙනිරිඳුගෙ නිති

මෙදියත දිව සියල් තද තෙදග නොනැවති - රුපුකත නෙත සිලිල් සිඳු තෙර වැද නැවතී

(සත්ත්වයාගේ සිතෙහි රැඳුණු නිර්මල ගුණයෙන් ප්‍රසිද්ධ වික්‍රමයත් ඇති, ශ්‍රියා කාන්තාවගේ ශ්‍රී පද්මය වැනි මේ රජුගේ මහත්වූ තේජස් ගින්න මේ මුළු ලෝකය පුරා නිතරම දිවගොස් නොනැවතී සතුරු අඹුවන්ගේ කඳුළු නමැති සමුද්‍ර තීරයට පැමිණ නතර විය) (ප්‍රේමරත්න,2002:89).

මෙහිදීද සිරිකත නිවසන පද්මය ඒ පැරකුම් රජුන් වීමෙන් රජුගේ ඉසුරුමත් බව ප්‍රකට කිරීමට කවියා උත්සාහ දරා ඇති බව පැහැදිලිය. එසේම සැළලිහිණියෙහි රම්භා නම්වූ දිව්‍යාංගනාවගේ සැමියා සේ රූ සිරින් යුතු යැයි පවසන පැරකුම් නිරිඳු, උතුම්වූ ඉසුරෙන් ජම්බා නම් අසුරයාගේ විරුද්ධකාරයාවූ ශක්‍රයා බඳු යැයි ගිරාවෙහි සඳහන් කර ඇත. ඒ මෙසේය.

පවර ඉසුරු පරසිඳු දම්බා විරිඳු - විරිඳු නිරිඳු මත ගජ කුම්බා මිගිඳු

සතත සුසිරි නය නොකලම්බා පුරුදු - වැජඹී සොඳුරු සිරි පැරකුම්බා නිරිඳු

(ජම්භ නමැති අසුරයා නසන ලද හෙයින් ජම්භ විරෝධි හෙවත් ජම්භගේ විරුද්ධකාරයා නම්වූ ශක්‍රයා උතුම් සැපතින් ප්‍රසිද්ධ කෙනෙකි. පැරකුම් රජුද එබඳුය. රජුද විරුද්ධ රජුන් නමැති මත් ඇතුන්ගේ කුම්භ බිඳින සිංහ රාජයෙකි. නිතර සුචරිත මාර්ගය නොකලඹා පුරුදු වූවෙකි) (පියරතන හිමි,1991:89).

විචාරක අදහසට අනුව ''ගිරා සන්දේශය, සැළලිහිණි සන්දේශය තරම් ජනප්‍රිය නොවීමට එක් හේතුවක් නම් බොහෝවිට එහි තේරුම් ගැනීමට නොහැකි වචන බොහෝ සෙයින් යෙදී තිබීමය. බොහෝ විට ඇතැම් කවිවල අර්ථය කිහිපවරක්ම විවරණය නොබලා තේරුම් ගැනීම දුෂ්කරය'' (වීරසිංහ,1953:67). ගිරාකරුවා දැන හෝ නොදැන බොහෝ අප්‍රකට වචන යොදා ගැනීම ඊට හේතුවයි.

3.3. සුබ නැකැත් හා සුබ නිමිති බැලීම

දූතයාට පිටත්වීමට පෙර සුබ නැකැත් හා සුබ නිමිති බැලීමට නියම කිරීමේ ක්‍රමවේදය තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචිත පරෙවි සන්දේශයේ මෙන්ම සැළලිහිණි සන්දේශයේදීත් එක සේ අනුගමනය කර තිබූ සිරිතකි. ගිරා සන්දේශයෙහිද දූතයාට සුබ මොහොතින් පිටත් වන ලෙස හා සුබ ලකුණු බැලීමට පැවසීමෙන්

පැහැදිලි වන්නේ, ගිරාකරුවා අනුගමනය කර ඇත්තේත් රාහුල හිමියන් අනුදත් ක්‍රමවේදයම බවයි. ඒ අනුව බ්‍රහස්පතී තාරකාව උදා වන කල චන්ද්‍රයා අස්විද නැකතට මුදුනේදී පැමිණි වේලාව සැළලිහිණියාට ගමන් ඇරඹීමට සුදුසුම වේලාව ලෙස කතුවරයා දක්වා ඇත. ඒ අස්විද නැකත ගමනෙහි ශ්‍රේෂ්ඨ බව කියැවෙන නිසාය.

උදේ සැපත් සුරගුරු අලුකර අවට - සඳේ මුදුන්පත් අස්විද නැකත සිට

නදේ සිතින් තම කුල දෙවිය සිහි කොට - යෙදේ ගමන් යහළුව මෙපුරෙන් තොපට (ගුණවර්ධන, 1997:53).

ගිරවාට පුරයෙන් නික්ම යාමට සුදුසු මොහොත ලෙස ගිරාකරුවා දක්වා ඇත්තේ ඉරිදා දිනයේ හිරු නැකතින් කිවි, සුර ගුරු දෙදෙන සිටින කන්‍යා රාශියෙනි. මෙය පුරාතන ඍෂීන් විසින් ගමන් යාම සඳහා නියම කරන ලද ශ්‍රේෂ්ඨ යෝගයකි. මේ වනාහි උතුරුපල් ගුණ නැකතයි. අමෘතයෝගයයි. ඉරිදා දිනයට එය ශුභ හා යෝග්‍ය වන්නේ අවයෝග හා මරයෝග ආදී දෝෂයන්ගෙන් තොර හත නැකැතෙහි සිටීම නිසාය.

පොරණ රුසින් කී තොප යතුරට පවර - ලද නිදොසින් රිවි දින නකත දිනකර

කුමරි රසින් කිවි සුර ගුරු සිටි නොහැර - මිතුර තොසින් වඩු සිහිකර මෙත් සුතුර

(පියරතන හිමි,1991:116-117).

කෙසේ වුවද සන්දේශකරුවන් දෙදෙනාම සුබ ගමනකට යෝග්‍ය නැකැත් දෙකක් සිය හාරකයන්ට ලබාදී ඇත.

සුබ නිමිති බැලීමේදීත් කවීන් දෙදෙනාම පොදුවේ මියුරු අඹගෙඩි සහ කාන්තාවන් පෙර නිමිති ලෙස දැකීමට සුදුසු යැයි නියම කර ඇත. මේ හැරුණු කොට සැළලිහිණිකරුවා සුවඳ මද පවන්, පිරුණු කළ, පිපුණු සුදු මල්, ප්‍රිය වචන, රන් කෙණ්ඩි, සලන සෙමෙර, සුදු පැහැ කුඩ හා ප්‍රීතියෙන් මත්වූ ඇතුන් යන සුබ නිමිති දැකීම සුබ නැකතටත් වඩා අගනා බව දක්වා ඇත (ගුණවර්ධන, 1997:54). එහෙත් ගිරාකරුවා පවසා ඇත්තේ මී පැණි මිශ්‍ර විළඳ, දිග උක්දඬු හා පැසුණු දෙළුම් යන පෙර නිමිති බලනා ලෙසටයි (පියරතන හිමි,1991:117). කෙසේ වුවද සුබ නැකැත් හා සුබ නිමිති බැලීම සැළලිහිණිකරුවා සේම ගිරාකරුවාද එක සේ අනුගමනය කර ඇති බව පෙනේ. තවද දූතයන් දෙදෙනාම සුබ නැකතින් පෙර නිමිති බලා නික්ම යන්නේ පුර වර්ණනය හා රාජ වර්ණනය සිදු කිරීමෙන් අනතුරුවය.

3.4. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි වර්ණනා

සැළලිහිණි සන්දේශය රචනා කරනු ලැබුවේ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසිනි. එසේම ගිරා සන්දේශයේ ග්‍රාහකයා වී ඇති නාථ දෙවියන්ට සන්දේශගත පණිවිඩය දැනුම් දෙනු ලැබ ඇත්තේ සැළලිහිණි කතුවරයාවූ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් ලවාය. එනිසා මෙකී සන්දේශද්වයයේදීම රාහුල හිමියන් වර්ණනා කරනු ලැබ ඇත. සැළලිහිණියේදී කතුවර හිමියන් විසින් තමන්වහන්සේ ගැනම පවසනු ලබන අතර ගිරාවේදී උන්වහන්සේ වර්ණනා කරනු ලැබ ඇත්තේ මහා සංඝයාවහන්සේලාගේ අනුදැනුමෙන් යුතුව ගිරා කතුවරයා විසිනි. ගිරා සන්දේශයේදී රාහුල හිමියන් ගැන සඳහන් කර ඇත්තේ මෙසේය.

තෙවළා රුවනකර උඩු යටි කර රුවට - අලළා ගැඹුර පද'රුත් මිණි දෙන ලොවට

තෙවළා වදනිසුරු විජයබ තෙරිඳුහට - නොවළා ගොසින් ම හසුන් සැළ කරව සිට

(ත්‍රිපිටක වාගීශ්වර විජයබාහු ස්ථවිරෝත්තමයා ත්‍රිපිටකය නමැති මුහුද උඩු යටි කර මනා සේ කළඹා ගැඹුරු පදාර්ථ නමැති රුවන් ලෝකයට දෙන්නෙකි. නොවරදවා ගොස් සිට එතුමාට මාගේ හසුන දන්වනු මැනවි) (පියරතන හිමි,1991:62).

මෙහි විජයබ තෙරිඳු යනු තොටගමුවේ විජයබාහු පරිවේණාධිපති ශ්‍රී රාහුල මාහිමිපාණන්වහන්සේය. ඒ අනුව සිංහල සන්දේශ සාහිත්‍යයේදී එතෙක් සන්දේශහරණය කළ දූතයන් සන්දේශය දෙවියන් වෙතට රැගෙන ගිය ක්‍රමවේදය බණ්ඩනය වී ඇති බව පෙනේ. එනම්, දෙවියන්ගේ පිහිට අයැදූ බව කියවෙන සන්දේශ වෙනත් ප්‍රභුවරයෙකු වෙත රැගෙන යාම හෝ සෘජුව දෙවියන් කරා ගෙන යාම දූතයන් විසින් සිදු කරනු ලැබීමය. එහෙත් ගිරා සන්දේශයේදී දූතයා සන්දේශය රැගෙන යන්නේ රාහුල හිමියන් වෙතටය. නාථ දෙවියන් වෙත අස්න ඉදිරිපත් කරනු ලැබුවේ තොටගමුවේ ශ්‍රී රාහුල නාහිමියන් විසිනි. පසුව හංසකරුවා අනුගමනය කර ඇත්තේත් මේ පිළිවෙතමය. තවද එම සන්දේශයේම 250 වන කවියේ සඳහන් වන පරිදි ගිරා සන්දේශය රචනා කර ඇත්තේ මහා සංඝයාගේ මෙහෙයවීමෙන් බව තහවුරු කොට දක්වා ඇත.

පවර මුනි වදහළ - පිළිවෙත් නොහැර දැනගෙන

සමඟ පවර සැප සැබවින් සිදු කරන

සමඟ මහඟු මහ සඟ ගණ මෙහෙවරින

මුළු ලොවට වැඩ වන තෙපලෙක මෙ මා පවසන

(උතුම්වූ බුදුරජාණන්වහන්සේ වදාහළ ප්‍රතිපත්ති අත නොහැර වාසය කරන දිව්‍ය ලෝක සයෙහි සම්පත් සත්‍ය වසයෙන්ම සිද්ධ කරන මහාර්ඝ මහා සංඝයා වහන්සේලාගේ නියමයෙන් මා කියන වචනයෙකි මෙය) (පියරතන හිමි,1991:235).

මෙහි ''සමඟ මහඟු මහ සඟ ගණ මෙහෙවරින'' යන්නෙන් දක්වා ඇත්තේ එයයි.

උක්ත සියලු කරුණු අනුව පැහැදිලි වන්නේ ගිරාකරුවා සිය දූතයාට සන්දේශය ගෙන යන ලෙස නියම කර ඇත්තේ, සැළලිහිණි සන්දේශය රචනා කළ තොටගමුවේ ශ්‍රී රාහුල හිමි විසූ 'තෙල්වත්තේ රත්පත් වෙහෙර' නමින් ප්‍රකටවූ විජයබාහු පිරිවෙණ ස්ථාපිතවූ තොටගමුව වෙහෙරටයි (පියරතන හිමි,1991:65). ඉන් ව්‍යංග්‍යාර්ථවත් වන්නේ ගිරා සඳෙස්කරුවා නියෝජනය කරනුයේද රාහුල හිමියන්ගේ ගුරුකුලයම බවයිඃ භික්ෂු පරම්පරාවම බවයි. මේ බව කේ. ඩී. පී. වික්‍රමසිංහ දක්වා ඇත්තේ මෙසේය. ''ගිරා සන්දේශය යැවෙන්නේ ශ්‍රී රාහුල මාහිමියන් ලවා තොටගමු වෙහෙරෙහි නාථ දේවයන්ගේ ආශිර්වාදය හා රැකවරණ මහරජුහට හා ලක් බුදුසසුනට ලබාදීම සඳහා හෙයින් ගිරා සන්දේශ කතුවරයාද ශ්‍රී රාහුල මාහිමියන් මෙන්ම නාථ දේවයන් ඇදහූ කෙනෙකු බව හෙළි වේ'' (වික්‍රමසිංහ,1964:356).

සැළලිහිණි සන්දේශයේදී රාහුල හිමියන් කතු පවත දක්වමින් තමන්වහන්සේ හඳුන්වාදී ඇත්තේ මෙසේය.

කඳවුරු කුල මැදුර මිණි පහනෙව් සුසැදී - නැණගුරු සබස සමයද දනුමෙන් වොරැදී

රජගුරු විජයබා පිරුවන් හිමි පැහැදී - මෙමියුරු පදැති සැළලිහිණිය අස්න යෙදී

(කඳවුරු කුල නම්වූ භවනයෙහි පිහිටියාවූ මාණික්‍යමය ප්‍රදීපයක් වැනි නුවණින් සුරගුරු වැනි ෂඩ් භාෂාවන් හා ස්වකීයවූද පරතන්ත්‍රවූද ආගම්ද දනගෙන වැඩ සිටින රාජගුරු විජයබා පිරුවෙන් හිමි සතුටුව මිහිරි පද ඇති මේ සැළලිහිණිය සන්දේශය රචනා කළේය) (ගුණවර්ධන, 1997:177).

එහිදී උන්වහන්සේ විජයබා පිරුවෙනෙහි වැඩ වාසය කරන හිමි නමක ලෙස පමණක් තමන්වහන්සේව හඳුන්වාදී ඇත. එහෙත් ගිරා සන්දේශයේ රාහුල හිමියන් වර්ණනා කර ඇත්තේ මෙසේය.

කඳවුරුගම් කුල - දලනිඳු ලකළ මුදලිඳු

පිවිතුරු උතුරු මූළ මහ තෙරිඳුට සොඳුරු

මුනුබුරු මහරු ගුණසරු පිළිවෙත් ගැඹුරු

කිවිකැල මුදුනු මල් - කළ තම තෙපුල් හැම කල

මනරම් මුනි සසුන් වැඩ පිණිස නිකසළ - පැරකුම් රජු විසින් සුත පෙමිනි ඇති කළ

සිරිබර මෙසිරි ලකඟන පැළැඳි පිරිසුදු - පුවතර මහ වෙහෙර වැසි තෙර ගණ සිනිඳු

මනහර රුවන් වැළ මැද බඳ මිණෙක බඳු - නමකර පවර විජයබ පිරුවන් තෙරිඳු

(ස්නක්ධවාරග්‍රාම කුලය නමැති සමුද්‍රය අලංකාර කළ මහාමේරු පර්වතය වැනි, පිරිසුදු සුන්දර උත්තරමූල මහා ස්ථවිරයන්ට මුනුබුරු, මහාර්හ ගුණයෙන් සාර, ප්‍රතිපත්තියෙන් ගැඹුරු, සියලු කල්හිම තමන්ගේ වචනය කවීන් සමූහයාගේ මුදුනෙහි පළඳින පුෂ්පය බවට පත් කළ, නොකැළැල්, මනරම් බුද්ධ ශාසනයෙහි හිත පිණිස පරාක්‍රම රජු විසින් පුත්‍ර ප්‍රේමයෙන් ඇති කළාවූ සිරියෙන් බර මේ ශ්‍රී ලංකාව නමැති කාන්තාව පැළැඳි පවිත්‍ර, ප්‍රසිද්ධ මහා විහාරවාසී ස්නිග්ධ ගුණ ඇති ස්ථවිරවරුන් නමැති මනෝහර රත්නාවලිය මැද බැඳි මැණිකක් හා සමානවූ උතුම් විජයබාහු විහාර අධිපති ස්ථවිරයන්වහන්සේට නමස්කාර කරව) (ප්‍රේමරත්න,2002:191).

ඉහත දැක්වූ 232 වැනි කවියට අනුව රාහුල හිමියන් වූකලී විල්ගම්මුල, ගලතුරුමුල, මහනෙත් පාමුළ යනාදී වසයෙන් 'අට ගණය' නමින් ව්‍යවහාරවූ භික්ෂු පරම්පරා අටෙන් උතුරු මුළ පරපුරට අයත් උතුරුමුළ මහ තෙරිඳුන්ගේ මුනුබුරෙක්ය. විචාරකයන්ගේ අදහස වන්නේ අභයගිරි විහාරයෙහි 'උත්තරොළ' නම් පිරිවෙණ මුල්කොට ගෙන උතුරුමුළ නම් පරපුර ඇතිවූ බවකි (පියරතන හිමි,1991:223). මේ උතුරුමුළ හෙවත් උත්තර මූලය අනුරාධපුර යුගයේ සිට පැවතුණු ආරාමික සංස්ථාවකි. වියත්පත් අට ගණය යනුවෙන් හැඳින්වුණු එවැනිවූ ආයතන අටක් පැවත ඇත. උතුරු මුළ (උත්තර මූළ), දකුණු මුළ (දක්ෂිණ මූළ), කපුරු මුළ (කප්පර මූළ), වහදුම් මුළ (වහදීපක මූළ), ගලතුරු මුළ (සේලන්තර මූළ), විල්ගම්මුළ (සරෝගාම මූළ), මහනෙත්පාමුළ (මහා නේත්‍ර ප්‍රාසාද මූළ), සෙනරත් මුළ (සේනාපති මූළ) යනු ඒවාය. මේ අතුරින් උතුරු මුළ, කපුරු මුළ, වහදුම් මුළ හා මහනෙත්පාමුළ අභයගිරි නිකාය හා සම්බන්ධව පැවතුණේ යැයි විශ්වාස කෙරේ. දකුණු මුළ හා සෙනරත් මුළ අයත්ව ඇත්තේ ජේතවන නිකායටයි. ගලතුරු මුළ හා විල්ගම්මුළ, මහා විහාරයට අයත්ව තිබුණේ යැයි සලකනු ලැබේ (රත්නපාල,2009:235). මේ උතුරුමුළ යති පරපුර පිළිබඳව සුචරිත ගම්ලත් දක්වන අදහස මෙබඳුය. '' 'උතුරුමුළ' යනු පුරාණ කාලයේ ලක්දිව වැජඹුණු යති පරපුරකි. එය 'දළදා සිරිතෙහි' සඳහන් වන්නේ 'උතුරුළුමුළ' යනුවෙනි. 'උතුරුළු' යනු පිරුවනක හෙවත් විහාරයක නමකි.... 'උතුරුළු' නම් ආගමික ආයතනයෙන් ඇරඹුණු භික්ෂු පරපුර 'උතුරුළුමුළ' නම් විය. පසුව එය සුඛෝච්චාරණය සඳහා 'උතුරුමුළ'යි සැකසිණ. උතුරුමුළ සඟ පරපුර අභයගිරි නිකායට අයත් ශාඛාවකි. මේ සඟ පරපුර ඇරඹුණේ ගෝකර්ණ සමුද්‍ර සමීපයෙහි හිඳ කඳ සුරිඳුන් පැහැදවීමට මන්ත්‍ර ජප කොට එයින්ම ඇසක් අඳවූ නමුදු කඳකුමර වර ලද 'මානවම්ම' නම් රජ කුමරෙකුගෙනි. ඔහු අභයගිරියෙහි පැවිදිව 'මාහාසාමි' හෙවත් 'මාහිමි' පදවියට පත්විය. කලින් කල 'උතුරුමුළ' පරම්පරාවේ ප්‍රධානත්වයට පත්වූ තෙරවරු 'උතුරුමුළ මහ තෙරිඳු' නම් වූහ'' (ගම්ලත්,2006:12). එසේම තවත් විචාරක අදහසක් වන්නේ රාහුල හිමියන් 'උතුරුමුළ මහ තෙරිඳුන්ගේ මුනුබුරු' වසයෙන් දක්වා ඇත්තේ උන්වහන්සේ උතුරුමුළ ආයතනයට අයත් නොවන නිසා බවය. මහ තෙරිඳුන්ගේ මුනුබුරු වසයෙන් දැක්වීමෙන් උන්වන්සේ උතුරුමුළ පරපුරට අයත් වන බවක් නොකියවන බවය (වික්‍රමසිංහ,1964:118). එසේම මෙහි 'පුවතර මහ වෙහෙර වැසි' යන්නෙන් උන්වහන්සේ 'මහා විහාර වංශයට' අයත් බව පවසා ඇති බව තවත් අදහසකි. පෙර ලක්දිව මහා විහාර, අභයගිරි හා ජේතවන යනුවෙන් ප්‍රධාන නිකාය තුනක් පැවති බවත් රාහුල හිමියන් අයත්ව ඇත්තේ අනුරාධපුර මහා විහාරයෙහි භික්ෂු සංඝ පරම්පරාවට බවත් මේ කවියෙන්

ධ්වනිතාර්ථවත් වී ඇති බව පියරතන හිමියන්ගේ අදහසයි (පියරතන හිමි,1991:223). උතුරුමුළ මහා තෙරිඳුන්ගේ මුනුබුරු බව දැක්වීමෙන් ගිරාකරුවා තමා අයත් රාහුල හිමියන්ගේ භික්ෂු පරම්පරාව අතිශයෝක්තියෙන් දක්වා ඇත.

උක්ත 232 වැනි කවියේ සිට 248 කවිය දක්වා කවි 16ක්ම ගිරාකරුවා වැය කර ඇත්තේ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් වර්ණනා කිරීමටය. සිරි පැරකුම් රජුත් මෙරට බුදු සසුනත් ආරක්ෂා කර දෙන ලෙස නාථ දෙවියන්ගේ ඉල්ලා සිටීමේ පණිවිඩය පිටුපස ඇති සැබෑ අභිමතාර්ථය වී ඇත්තේ රාහුල හිමියන් අතිශයෝක්තියෙන් වර්ණනා කිරීම බව මෙයින් මනාව ප්‍රත්‍යක්ෂ වේ. එය වඩාත් තීව්‍ර වන්නේ 247 වැනි කවියෙනි. එහි රාහුල හිමියන් රජුට සමාන කර දක්වා ඇත. මේ පිළිබඳව සිරි තිලකසිරිගේ මතය මෙසේය. ''සිරි රහල් තෙරිඳු එසේ රජකු හා සමාන වන්නේ ශීලය, කීර්තිය, මෛත්‍රිය, ගුණය, ඥානය, අකාමය හා තවුස් බව ආදි ගුණයන් හේතු කොටගෙනය. කෙසේ නමුත් ගිරා කවියා සිරි රහල් තෙරණුවන් රජකු හා සමාන කොට වැනුමට ලක් කරන්නේ එතුමන් රජකුට නොදෙවැනි බව පෙන්නා දීමට යයි සිතමු'' (තිලකසිරි,2005:60). මෙබඳු වර්ණනාවක් රාහුල හිමියන් අරභයා සිදු කරමින් ගිරාකරුවා පවසා සිටින්නේ මේ සියල්ල සිදු කෙරෙනුයේ මහා සංඝයාගේ අනුදැනුම ප්‍රකාරව උන්වහන්සේලාගේ මෙහෙයවීමෙන් බවය. ඒ අනුව පැහැදිලි වන්නේ ගිරා සන්දේශයේ අභිමතාර්ථය වී ඇත්තේම රාහුල හිමියන් වර්ණනා කිරීම බවය.

4. සමාලෝචනය

මෙම සාකච්ඡාවට පාදකවූ සැළලිහිණි සන්දේශය හා ගිරා සන්දේශය රචනා කර ඇත්තේ කෝට්ටේ යුගයේදීය. සන්දේශ දූතයන් වන සැළලිහිණියා හා ගිරවා යන දෙදෙනාම පිටත්ව ඇත්තේ ජයවර්ධනපුරයෙන් වීම හේතුවෙන් පුර හා රජ වැනුම් සන්දේශද්වයයටම පොදු වී ඇත. තවද ගිරා සඳෙසෙහි සන්දේශ ග්‍රාහකයා වන නාථ දෙවියන්ට සන්දේශය දැනුම් දෙනු ලබන තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් වනාහි සැළලිහිණි සඳෙසෙහි කතුවරයාය. ඒ අනුව පැහැදිලි වන්නේ ගිරාකරුවා පැහැදිලිවම නියෝජනය කරනුයේ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ භික්ෂු පරම්පරාව බවයි. පුර වර්ණනයේදීත් රාජ වර්ණනයේදීත් ගිරාකරුවා සැළලිහිණිය අනුදත් මගම ගෙන ඇති බව පැහැදිලිව පෙනේ. පද සංඝටනාව, ශබ්ද රසය උද්දීපනය කිරීම, අර්ථය ධ්වනිත කිරීම මතු නොව පුරාණෝක්ති භාවිතයේදීත් සැළලිහිණිකරුවා අනුගමනය කර ඇති බව හඳුනාගත හැකිය. පැහැදිලිවම ගිරා සන්දේශයේ සන්දර්භය ගොඩ නැගීමේදීද ගිරාකරුවා පාදක කරගෙන ඇත්තේ සැළලිහිණියයි. දූතයාට ආසිරි පැතීම, දූත වැනුම, නිර්දේශ හෙවත් කටයුතු දැක්වීම යනාදීවූ සන්දේශකරණයේ අනිවාර්ය අවස්ථාවලින් අනතුරුව සන්දේශද්වයයේම කවීන් පුරය වර්ණනා කිරීම සිදු කර ඇත. සැළලිහිණිකරුවා සිය දූතයාට රජු හමුවීමට නියම කර ඇත්තේ සුබ නැකතින් සුබ නිමිති දැක, දළදාවහන්සේ වැඳ පුදා ගැනීමෙන් අනතුරුවය. ගිරාකරුවා රජුගෙන් අවසර ගෙන, දළදාවහන්සේ වැඳ පුදාගෙන සුබ නැකතින් සුබ නිමිති දැක පුරයෙන් නික්මෙන ලෙස සිය දූතයාට උපදෙස්දී ඇත. එතැන් සිට මග වැනුම, දියකෙළි වැනුම, සැඳෑ වැනුම ආදිය යොදා ගෙන ඇත්තේ එකම පිළිවෙළටය. (සැළලිහිණියට වඩා ගිරාවේ ගමන දුර බැවින් අමතර වැනුම් එක් වී ඇත.) සුබ නිමිති හා සුබ නැකැත් බැලීමේදීද ගිරාවට ලැබී ඇත්තේ සැළලිහිණියේ බලපෑමමය. මේ සෑම කරුණකටම වඩා ගිරාකරුවා සැළලිහිණිකරුවාට පක්ෂපාති වී ඇත්තේ රාහුල හිමි වර්ණනයේදීය. සැළලිහිණිකරුවා පැරකුම් රජු වර්ණනා කළේ යම් සේද එය අභිභවන අයුරින් රාහුල හිමියන්ගේ දැනුම, ප්‍රතිභාව, ධර්ම ඥානය, ප්‍රසිද්ධිය, උත්තරීතරත්වය මෙන්ම උන්වහන්සේ සතුවූ අප්‍රමාණ බලයද ගිරා සන්දේශයෙන් උද්දීපනය කොට දක්වා ඇත. රාහුල හිමියන් සතුවූ මේ බලය යනු කවරෙක් දැයි සිරි තිලකසිරි මෙසේ දක්වා ඇත. ''පැරකුම්බා රජුත්, සිරි රහල් මහතෙරණුවනුත් මේ සා මහත් වැනුමකට ලක්කිරීම මගින් ගිරා කවියා හඟවා සිටින්නේ එය තමාගේම අදහසක් නොව මහසඟනගේ මෙහෙයවීමෙන් පවසන අදහසක් බවය. මේ වනාහි ජයවර්ධනපුරයේ අනාගත රජු තෝරා ගැනීම පිළිබඳ වගකීම මේ දෙදෙනා සතු බව හා ඔවුන්ගේ අභිලාෂය

මහසඟනත්, රට වැසියාත් අනුමත කරන බව ව්‍යංග්‍යයෙන් ප්‍රකාශ කිරීමක් නොවිය හැකිද?'' (තිලකසිරි,2005:60). මේ අනුව පැහැදිලි වන්නේ ගිරා සන්දේශය රචනා කර ඇත්තේම සැලළිහිණි සන්දේශය අනුගමනය කරමින් බවයි. සැලළිහිණිය නියෝජනය කළ ග්‍රාමවාසී නිකායේ අනුදැනුමෙන් බවයි. මේ සන්දේශද්වයයේ සමානතා දැකිය හැකි වන්නේ මේ කරුණු නිසා බව එනයින් හඳුනාගත හැකිය.

පරිශීලිත මූලාශ්‍රය

ගම්ලත්, සුචරිත. (සංස්.). (1995). ***සැළලිහිණි සන්දේශය***, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ගම්ලත්, සුචරිත. (සංස්.). (2006). ***මේ මියුරු පදැති සැළලිහිණිය***, කොළඹ 10: සහස්‍ර ප්‍රකාශකයෝ.

ගුණවර්ධන, වී. ඩී. එස්., (සංස්.). (1997). ***සැළලිහිණි සන්දේශය***, කොළඹ 10: සමයවර්ධන ප්‍රකාශන.

තිලකසිරි, සිරි. (2005). ***සිංහල සන්දේශ කාව්‍යයේ දේශපාලන පසුබිම***, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

තෙන්නකෝන්, රැ., (1960). ***අපේ පැරණි අසුන් කවි,*** කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

නාරද හිමි, කිවුලේගෙදර. (2005). ***සම්භාව්‍ය සිංහල පද්‍ය කාව්‍ය උද්ධෘත***, හෝමාගම.

පියරතන හිමි, මකුළුදූවේ. (සංස්.). (1991). ***ගිරා සන්දේශය***, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ප්‍රේමරත්න, කේ. ජී., (සංස්.). (2002). ***ගිරා සන්දේශය***, කොළඹ 12: ප්‍රදීප ප්‍රකාශකයෝ.

රත්නපාල, ඊ. ඇම්., (2009). ***සිංහල සාහිත්‍ය ප්‍රදීපය දැල්වූ පැරණි ලේඛකයෝ***, වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ.

වික්‍රමසිංහ, කේ. ඩී. පී., (1964), ***කෝට්ටේ යුගයේ සිංහල සාහිත්‍යය***, කර්තෘ ප්‍රකාශන.

සන්නස්ගල, පුඤ්චි බණ්ඩාර. (1962). ***සිංහල සන්දේශ සාහිත්‍යය***, කොළඹ: ලේක්හවුස් මුද්‍රණාලය.

ගුණසේකර, බන්දුසේන. (වර්ෂයක් සඳහන් නොවේ). ***තොටගමුවයි ශ්‍රී රාහුල මාහිමියි,*** (වාර්ෂික කලාපය, තුන්වන පියවර), සාහිත්‍ය ධාරා, (සංස්.). ඩී. ජී. පතිරණ, ගාල්ල: දකුණු පළාතේ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

ධම්මරතන හිමි, හිස්සැල්ලේ. ***ගිරා-හංස සන්දේශ තරගය,*** (1964-1965, 4 කලාපය), ශාස්ත්‍රෝදය, (සංස්. තිබ්බටුමුණුවේ පුඤ්ඤරතන හිමි සහ පී. එම්. ජයවර්ධන), ශාස්ත්‍රෝදය විශ්වවිද්‍යාලයේ පාරිවේණික ශිෂ්‍ය සංගමය.

සීලවංස හිමි, මැල්ලව. ***සන්දේශාවලියේ හංස සන්දේශය හා වැනුම් මග,*** (1964-1965, 4 කලාපය), ශාස්ත්‍රෝදය, (සංස්. තිබ්බටුමුණුවේ පුඤ්ඤරතන හිමි සහ පී. එම්. ජයවර්ධන), ශාස්ත්‍රෝදය විශ්වවිද්‍යාලයේ පාරිවේණික ශිෂ්‍ය සංගමය.

වීරසිංහ, අමරදාස. ***ගිරා සන්දේශකාරයාගේ වර්ණනා ශක්තිය,*** (1953,1 කලාපය, තුන්වැනි සඟරාව) සංස්කෘති, (සංස්.) අමරදාස වීරසිංහ, කොළඹ: සංස්කෘති ප්‍රකාශන.